මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 10 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

## I පත්‍රය

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

01 ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී වඩාත් විශ්වාසදායි මූලාශ්‍රය වන්නේ,
1 මහා වංශයට 2 සමන්තපාසාදිකාව 3 බෝධිවංශය 4 දීපවංශය

02 රජරට ශිෂ්ටාචාර සමයේ ඉතිහාසය හැදෑරීමට වඩාත් නිවැරදි තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍රයක් නොවන්නේ,
1 පූජාවලිය 2 නිකාය සංග්‍රහය 3 බෝධිවංශය 4 ථූපවංශය

03 ලංකාවට පැමිණ තොරතුරු වාර්තා කළ අරාබි ජාතික ලේඛකයකු වන්නේ,
1 ඇරිස්ටෝටල් ය 2 මෙගස්තිනිස් ය 3 ඉබන් බතූතා ය 4 ප්ලිනි

04 ලංකාව පිළිබඳ අසා දැනගත් තොරතුරු වාර්තා කළ ලේඛකයකු වන්නේ,
1 ඇරිස්ටෝටල් ය 2 රොබට් නොක්ස් ය 3 ඉබන් බතූතා ය 4 පාහියන් හිමි

05 පහත **අ** සහ **ආ** තීරය නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1 ඇරිස්ටෝටල් | A ඉන්ඩිකා |
| 2 ටොලමි | B ඩිමුන්ඩෝ |
| 3 මෙගස්තිනිස් | C නැචුරාලිස් හිස්ටෝරියා |
| 4 ප්ලිනි | D අර්ථ ශාස්ත්‍රය |
| 5 කෞටිල්‍ය | E භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය |

1 ABCDE 2 BDACE 3 BEACD 4 BEADC

07 අතීතයේ භික්ෂූන් වහන්සේලාට පූජාකල ගල්ලෙන් වල කටාරම අසල කෙටූ ලේඛන හඳුන්වන්නේ,
1 ටැම් ලිපි 2 ගිරි ලිපි 3 පුවරු ලිපි 4 ලෙන් ලිපි

08 පහතරට තෙත් කලාපීය ලෙන් සඳහා දැක්විය හැකි උදාහරණ
1 මිනිහාගල්කන්ද,බුන්දල 2 පාහියන්ගල , බටදොඹලෙන 3 අලිගල හා පොතාන 4 බෙල්ලන්බැඳිලැස්ස,පොතාන

09 මෙයට වසර 125000 කට පෙර මෙරට මානවයින් ඇට වර්ග පුළුස්සා ආහාරයට ගත් බවට සාක්ෂි හමුවන ස්ථානයක් වන්නේ,
1 කිතුල්ගල බෙලිලෙන 2 බටදොඹලෙන 3 රාවනා ඇල්ල ලෙන 4 බෙල්ලන්බැඳිලැස්ස

10 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ උපරිම ආයු කාලය වූයේ, අවුරුදු
1. 60 -75 අතර 2. 35 - 40 අතර 3. 30 - 35 අතර 4. 50 - 55 අතර

11 කොළඹගේආර රංචාමඩම රජයේ විද්‍යාලයේ කැනීම් වලින් මතු වූයේ,
1 මුල් ඓතිහාසික යුගයේ සොහොන් බිමකි 2 පූර්ව ඓතිහාසික යුගයේ සොහොන් බිමකි
3 ප්‍රාග් ඓතිහාසික යුගයේ සොහොන් බිමකි 4 ඓතිහාසික යුගයේ සොහොන් බිමකි

12 අතීතයේදි වරාය ආශ්‍රිතව තිබූ ගම් හඳුන්වා ඇත්තේ,
1 පට්ඨාන ගාම 2 කේවට්ඨ ගාම 3 කසීකාර ගාම 4 වඩ්ඩකීගාම

13 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ඉපැරණිම තොරතුරු ලැබුනු ස්ථානය වන්නේ,
1 පාහියන්ගලෙනි 2 පතිරාජවෙලෙනි 3 බෙල්ලන්බැඳිලැස්සෙනි 4 බටදොඹලෙනෙනි



EXAMRESULTS.LK

14 යකඩ ලෝහය භාවිතා කිරීම ආරම්භ වූයේ,

1 මුල් ඓතිහාසික යුගයේ දිය 2 පූර්ව ඓතිහාසික යුගයේ දිය 3 ප්‍රාග් ඓතිහාසික යුගයේ දිය 4 ඓතිහාසික යුගයේ දිය

14 මුල් ඓතිහාසික යුගය ලෙසින් සැලකෙනුයේ,

1 ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 300 අතර කාලයයි. 2 ක්‍රි.පූ. 400 - ක්‍රි.ව. 600 අතර කාලයයි.

3 ක්‍රි.පූ. 3000 - ක්‍රි.පූ.500 අතර කාලයයි. 4 ක්‍රි.පූ. 450 - ක්‍රි.ව. 300 අතර කාලයයි.

15 1 වන විජයබාහු රජුගේ පනාකඩුව තඹ සන්නසේනෙහි **"නුරුපුර"** ලෙස හඳුන්වා ඇත්තේ

1 කතරගම 2 පොළොන්නරුව 3 අනුරාධපුරය 4 මාගම

16 පූර්ව ඓතිහාසික යුගයට අඳාලව ඇස් අඳුන් තැබීමට ලෝහ කූරක් භාවිත කළ බවට තොරතුරු ලැබුණු ස්ථානයක් වන්නේ ,

1 ඉබ්බන්කටුව 2 යටිගල්පොත්ත 3 යාපහුව ගල් සොහොන් කනත්ත 4 උඩරංචාමඩම

17 මෙරට සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා වන්නේ කවුරුන්ද?

1පණ්ඩුකාභය රජු 2 දේවානම් පියතිස්ස රජු 3 දුටු ගැමුණු රජු 4 වසභරජු

18 නර ඉසෙර යන විරුද නාමය භාවිත කළ අනුරාධපුර රාජධානියේ රජෙකු වන්නේ

1 1 වන කාශ්‍යප රජතුමා 2 දේවානම් පියතිස්ස රජු 3 දුටු ගැමුණු රජු 4 කුටකන්ණ අභය රජු

19 ක්‍රි:ව: 33-43 කාලයේදී තිස්සමහාරාම වැව ඉදිකරන ලද්දේ කවර රජෙකු විසින්ද?

1 වසභ රජු 2 මහසෙන් රජු 3 ඉලනාග රජු 4 අභයනාග රජු

20 පැරණි ගමක ජිවත් වූ වැසියෙකු ඊළඟ කන්නයේදී ලබාදෙන බවට පොරොන්දුව මත ගමිකගෙන් වී මල්ලක් ලබාගත් බව සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය කුමක්ද?

1 සද්ධර්මාලංකාරය 2 රාජාවලිය 3 ජාතකට්ඨ කතාව 4 සද්ධර්මරත්නාවලිය

21 පහත A තීරුවෙහි දක්වා ඇති කර්මාන්ත සහ B තීරුවෙහි එම කර්මාන්ත අතීතයේ හැඳින්වූ නම් සඳහන්වන අතර එය නිවැරිදිව ගලපා පිළිතුර තෝරන්න

| A | B |
|---|---|
| කම්මල් කර්මාන්තය | P තුලාධර |
| රන් කර්මාන්නය | Q දටික |
| ඇත්දත් කර්මාන්තය | R තනවය |
| රෙදි විවීම | S කබර |

1 SPQR 2 SPRQ 3 SRPQ 4 PQSR

22 අරාබි ජාතික ඉතිහාසඥයෙකු වන අල් - බලසූරි ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිත කරන ලද්දේ

1 සෙරන්ඩිබ් 2 සෙයිලාන් 3 තැප්‍රොබේන් 4 රතු කැට දිවයින

23 පැරණි සෙල්ලිපි වල වෙළඳ සමූහයක් හැඳින්වීමට භාවිත කරන ලද්දේ,

1 පදි නමිනි 2 වාපර 3 පූගය 4 පදිලද්දන්

24 අතීතයේ මෙරට ක්‍රියාත්මක වූ වෙළඳ සංවිධානයකට අයත් ලෝහ මුද්‍රාවක් හම්බන්තොට ප්‍රදේශයෙන් හමුවිය. එම වෙළඳ සංවිධානය වන්නේ,

1 වළඤ්ඤියාර් 2 නානාදේසින් 3 අයින්නූර්වර් 4 කාම්බෝජවරු

25 අගම්පඩි සේනාවක සහය පැතූ පළමු ලාංකික රජවරු දෙදෙනා කවුද?

1 අසේල රජු සහ උත්තිය රජු 2 I වන විජයබාහු හා II වන සේන රජු

3 ඉලනාග රජු හා අභයනාග රජු 4 IV වන කාශ්‍යප රජු හා I වන කාශ්‍යප රජු

26 දියකැට පහන යනු,

1 වැවෙන් රොන්මඩ ඉවත් කරන කොටස　　2 වැවෙන් ජලය පිටකරන විවරය

3 වැවට ජලය ගලාඒමට ගලින් තැනූ ආයත චතුරස්‍රාකාර අවකාශය

4 වැවෙන් ජලය මුදාහැරීමේදී භාවිත කරන සිරස් අතට සොරොව්වට සම්බන්ද කළ ගල් කුළුණකි

27 මැටි තට්ටුවක් , පස් තට්ටුවක් , බොරළු තට්ටුවක්, කිරිමැටි තට්ටුවක් ලෙස පස් තට්ටු කිහිපයක් එකිනෙක මත අතුරා ශක්තිමත් වැව් බැම්මක් නිර්මානය කර ඇති වැවකි,

1 පරාක්‍රම සමුද්‍රය　　2 මින්නේරිය වැව　　3 සීගිරිය මහ වැව　　4 යෝධ වැව

28 පැරණි මූලාශ්‍රවල අඩික යනු

1 වැව් වලින් බදු එකතු කළ අය　　2 වැව් තැනවූ අය
3 ඇළ මාර්ග තැනවීම හා සම්බන්ද අය　　4 ඇළ මාර්ගවල බදු එකතු කළ අය

29 අතීතයේ ස්වභාවික සුළං බලයෙන් යකඩ නිස්සාරණය කළ ස්ථානයක් වන්නේ,

1 දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයයි　　2 බලංගොඩ සමනළ වැව ප්‍රදේශයෙනි

3 බෙරගල ප්‍රදේශයෙනි　　4 සීගිරිය පොතාන ප්‍රදේශයෙනි

30 මංගර නැමති ස්වදේශික දෙවියෙකු උදෙසා කිරිමඩු යාගය පැවැත්වූ බවට තොරතුරු ලැබෙන ස්ථානයකි

1 පල්ලේබැද්ද ගල්පාය ප්‍රදේශයෙනි　　2 සීගිරිය අලකොළ වැව　　3 හල්දුම්මුල්ල බෙරගල　　4 ඉබ්බන්කටුව

31 දිග මැනීම සඳහා භාවිත කළකුඩාම ඒකකය වූයේ,

1 වීහ　　2 ගුන්ජා　　3 වියත　　4 පරමානුව

32 මෙරට ඓතිහාසික යුගයේ කුඩීන් යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1 නාවික කප්පිත්තන්　　2 දාසයන්　　3 සාමාන්‍ය ජනයා　　4 අතරමැදි පිරිස්

33 වැව් වලින් ජලය භාවිත කිරීම වෙනුවෙන් අයකළ බදු වර්ගයක් වන්නේ

1 දකපති　　2 බෙජකපති　　3 මතරමපිබක　　4 කැති අඩ

34 කිසිදු සතෙකු නොමැරිය යුතු බව සඳහන් කරමින් "මාඝාත නීතිය" නමින් නීතියක් පනවන ලද්දේ,

1 නිශ්ශංකමල්ල රජුය　　2 iv වන මහින්ද රජුය　　3 අමණ්ඩ ගාමිණී රජුය　　4 කුටකණ්ණතිස්ස රජුය

35 සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් "මධුපාචිකා" යන නමින් හඳුන්වා ඇති බව සඳහන් වන්නේ,

1 සද්ධර්මාලංකාරය　　2 සමන්තපාසාදිකාව　　3 රසවාහිනිය　　4 දම්පියා අටුවා ගැටපදය

36 ක්‍රි:පූ: 750 - 450 කාලයට අදාළව ඉන්දියාවෙන් ආනයනය කල පබළු භාවිත කර සෑදූ පබළු මාලයක් හමුවූ ස්ථානයක් වන්නේ

1 ඉබ්බන්කටුව　　2 යටිගල්පොත්ත　　3 යාපහුව ගල් සොහොන් කනත්ත　　4 උඩරංචාමඩම

37 තුනපහ වලට අයත් නොවන්නකි

1 සුදුදුරු　　2 කළුදුරු　　3 කොත්තමල්ලි　　4 කරබෑඹිය

38 තෙවරක් මෙරට පාලනය කල රැජිනකි

1 චූලසීවලී බිසව　　2 ලීලාවතී රැජින　　3 කල්‍යාණවතී රැජින　　4 අනුලා බිසව

39 කැනීම්වලදී මල් කැටයම් 21 සහිත වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක් හමුවූ ස්ථානයකි

1 අභයගිරිය　　2 ජේතවනය　　3 ආලාහන පිරිවෙණ　　4 ඉබ්බන්කටුව

40 මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, යන වැව් සඳහා ජලය ලබා ගැනීමට අඹන් ගඟ හරස්කර ඉදිකළ ඇළ මාර්ගය වන්නේ.

1 යෝධ ඇළ　　2 පබ්බතන්න ඇළ　　3 රිදීබැදි ඇළ　　4 ඇළහැර ඇළ

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 10 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

## II පත්‍රය

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න**

- **I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **II කොටසින් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි**

### I කොටස

01 (අ) පහත (I)යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(I) කලා වැව,මිනිහාගල්කන්ද, සෙංකඩගල, කදම්භ නදී, පාහියංගල, ගෝකන්න තිත්ථ, අනුරාධපුර, ඉබ්බන්කටුව, ජම්බුකොළපට්ටන, කොළඹ

(ලකුණු 10)

(II) බ්‍රිතාන්‍යය, ඉතාලිය, ජපානය, කොන්ස්තන්තිනෝපලය,කළු මුහුද, පෘතුගාලය, ප්‍රංශය, තුර්කිය

(ලකුණු 08)

(ආ) (I)පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්, ස්ථාන හා ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A- ලංකාව පිළිබඳ තොරතුරු වාර්ථාවන දකුණු ඉන්දිය ග්‍රන්ථයක් නම් කරන්න

B- ක්‍රි:ව: 90 -168 කාලය තුළ ලංකා සිතියමක් නිර්මාණය කළ භූගෝල ශාස්ත්‍රඥයා

C- උඩරට රාජධානියේ ආරම්භක පාලකයා

D- අශ්ව හිස සහ මිනිසා මූර්තිය පිහිටි ස්ථානය

(ලකුණු 04)

- යාබද A සහ B යටතේ දක්වා ඇති කලා නිර්මාණ හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න



**A**

1 මෙම නිර්මාණය කුමක් ද?

2 මෙය හමුවූ ස්ථානයේ ඇති චෛත්‍ය කුමක් සිහිවීමට ඉදිකරන ලද්දක්ද ?

3 මෙය තුළින් කුමන විද්‍යාත්මක මූලධර්මයක් නිරූපනය වන්නේද?

4 මෙය සොයා ගන්නා ලද්දේ කුමන ස්ථානයකින්ද?

(ලකුණු 04)



B

1 මෙම පින්තූරය කුමක්ද ?

2 මෙය ඇත්තේ කුමන ස්ථානයකද?

3 මෙය කුමන සියවසට අයත්ද?

4 මෙම පින්තූරයෙන් නිරූපනය වන්නේ කවුරුන්ද?

(ලකුණු 04)

## II කොටස

02 i අප රටින් හමුවූ විදේශීය කාසි වර්ග 02ක් නම්කරන්න

ii මහාවංශය රචනා කිරීමේදී අභාසය ලබාගත් මුල් කෘතීන් මොනවාද?

iii ඉතිහාසය හැදෑරීමේදී සාහිත්‍ය මූලාශ්‍ර වල ඇති ප්‍රයෝජන කෙටියෙන් දක්වන්න

iv ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන 4 ක් කෙටියෙන් දක්වන්න

03 i මෙරටට සංක්‍රමණය වූ මුල් මානවයා හැඳින්වූයේ කුමන නමකින්ද ?

ii ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ප්‍රධාන ප්‍රදේශ 02 මොනවාද?

iii ගල් යුගයේ මානවයාගේ ජීවන රටාව කෙටියෙන් දක්වන්න

iv පහත සඳහන් වචනවල අර්ථය පැහැදිලි කරන්න

A ශිලා මංජුසා සොහොන් B කුම්භිය නිබනන

04 i ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ බවට සාක්ෂි හමු වූ පහතරට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න

ii ශ්‍රී ලංකවේ ප්‍රාග් ඓතිහාසික මානවයන් ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග හතරක් නම්කරන්න

iii පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව හා ආහාර රටාව උදාහරණ සහිතව පැහැදිලි කරන්න

iv මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය පැහැදිලි කරන්න

05 i අපේ මුතුන් මිත්තෝ පහත සඳහන් විද්‍යාත්මක සාධක දැන සිටි බවට තොරතුරු ලැබුනු ස්ථාන එක බැගින් නම් කරන්න

A – දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බව

B – ශල්‍යකර්ම සඳහා ලෝහමය කතුරු භාවිත කිරීම

C – කානු පද්ධතියක් ඔස්සේ ගලා යන ජලය මත ලීඩනයක් එල්ල කර ජලමල් තැනීම

ii පහත A,B,C,D යටතේ දක්වා ඇති කරුණට අදාළ සෙල්ලිපි වරහන තුළින් තෝරා ලියන්න

A – පුරාන යුගයේ දඩුවම් ක්‍රම

B – වෙළඳ නීති රීති

C – රේගු බදු අය කිරීම

D – නිසි කළට සීසෑම නොකරන අයට දඩයක් නියම කරන බව

( සිතුල්පව්ව, තෝනිගල, වෙස්සගිරිය, ගොඩවාය, කොන්ඩවට්ටවාන් )

iii රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමට බලපෑ හේතුන් දෙකක් උදාහරණ දෙකක් ඇසුරින් පහදන්න

iv පළමුවන විජයබාහු රජුගෙන් සිදුවූ සේවය කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න

06 i මෙරට අතීතයේ පැවති රජත්ව සංකල්ප 03 ක් දක්වන්න

ii ගමික විසින් ඉටුකළ කාර්යයන් හතරක් දක්වන්න

iii මෙරට පැරණි සමාජයේ ගෙවිතැනෙහි ස්වභවය කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න

iv පැරණි ලංකාවේ වෙළදාම සිදුවූ ආකාරය සාධක 02 ක් ඇසුරින් පහදන්න

07 i අපේ මුතුන් මිත්තෝ හේන් වල වගා කළ ධාන්‍ය වර්ග දෙකක් ලියා දක්වන්න

ii ශ්‍රී ලංකාවෙන් සොයාගෙන ඇති දෙමළ සෙල්ලිපිවලට අනුව මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දීය වෙළඳ සම්භවයක් ඇති වෙළඳ සංවිධාන දෙකක් ලියා දක්වන්න?

iii මෙරට විසූ පැරැන්නන් ජල කලමණාකරණ කටයුතුවලදී ඒ සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම භාවිත කර ඇති ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

iv "පැරැන්නන්ට ලෙඩ රෝගවලින් ආරක්ෂාවීමට බොහෝවිට හැකි වූයේ ඔවුන්ගේ ආහාර රටාවයි" උදාහරණ සපයමින් පැහැදිලි කරන්න

08 i පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කරන තාක්ෂණය නිපදවා ගැනීමට පැරැන්නන් තැනූ ළිං විශේෂය කුමක්ද ?

ii ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාර දෙකක් ලියන්න

iii "දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙනි යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයාය" සාධක 02 ක් ඇසුරින් පහදන්න

iv පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රාජයේ සිටි වැදගත් පාලකයෙකු වන්නේ කුමක් නිසාදැයි කරුණු දෙකක් ඇසුරින් පහදන්න

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 10 ශ්‍රේණිය | පිළිතුරු පත්‍රය |
|---|---|---|

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 2 | 21. | 1 | 31. | 4 |
| 2. | 1 | 12. | 1 | 22. | 4 | 32. | 3 |
| 3. | 3 | 13. | 1 | 23. | 1 | 33. | 1 |
| 4. | 1 | 14.(i) | 2 | 24. | 2 | 34. | 3 |
| 5. | 3 | 14.(ii) | 4 | 25. | 3 | 35. | 1 |
| 6. | 3 | 15. | 3 | 26. | 4 | 36. | 4 |
| 7. | 2 | 16. | 4 | 27. | 3 | 37. | 4 |
| 8. | 2 | 17. | 1 | 28. | 3 | 38 | 2 |
| 9. | 2 | 18. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 3 | 19. | 3 | 30. | 1 | 40. | 4 |
| | | 20. | 1 | | | | |

### II පත්‍රය

**01.** ආ I

A. සිල්පදිකාරම් - මනිමේකලායි

B. ග්‍රීක ජාතික ටොලමි

C. සේනා සම්මත වික්‍රමබාහු

D. ඉසුරුමුනි විහාරය අසල

A. දැදිගම අත් පහණ
කොට වෙහෙර(සූතිඝර චෛත්‍යය) දැදිගම
අවල ජල විද්‍යාව
කොටවෙහෙරේ පාදමෙන්

B. 1. මිනිසා හා අශ්වහිස
2. ඉසුරුමුනියේ
3. දොළොස්වන සියවස
4.සොල්දාදුවෙක් හා අශ්වයෙක්

**02**.1. ස්වස්තික කාසි
හස් එබූ කාසි
ග්‍රීක-රෝමාකාසි

II. වංසත්තප් ප්‍රකාසිනිය - අට්ඨකථා- කුරුන්දී අට්ඨකතා / පාලි අට්ඨ කථා

III. පුරා විද්‍යා මූලාශ්‍රවල සඳහන් වන කරුණු තහවරු කර ගැනීමට
සාහිත්‍ය මූලාශ්‍රවල ඓතිහාසික සිදුවීම් විස්තරාත්මක දැක්වෙන නිසා
වඩා නිවැරදි තොරතුරු ඇතුලත් වී ඇති නිසා
විශ්වාසනීයත්වයෙන් ඉහළ නිසා………………..ආදී වශයෙන්

IV.අතීතයේ කල කී දේවල් ගැන දැන ගැනීම.
අනාගතයට අවශ්‍ය මග හෙලි කර ගැනීමට
රට දැය පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම
අන්‍ය මත වලට ගරු කිරීම -(මෙවැනි හේතු පිළිගත හැකි පරිදි ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

**03.** I. හෝමෝ සාපියන්
II. රංචාමඩම / ඉබ්බන්කටුව / සමනලවැව
III.දඩයමින් ජීවත් වීම - ආහාර සොයා බොහෝ දුර ඇවිදීම - සරල මෙවලම් භාවිතය - කණ්ඩායම් ලෙස ජීවත් වීම.
IV. ශිලා මංජුසා සොහොන්

**04.** I. -පාහියංගල
-කිතුල්ගල බෙලි ලෙන
-බටදොඹ ලෙන - බටතොට ලෙන (ලකුණු - 3)
II.බැදිදෙල් - වල්කෙසෙල් - දෝතලු-කැකුණ , ධාන්‍ය වර්ග , කටු අල , කිතුල් (ලකුණු-4)
III.පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව හා ආහාර රටාව උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු දෙන්න.(කරුණු දෙකට ලකුණු 2,විස්තරයට 3යි)
IV.ජනාවාස ගංගා වලින් පිටත ප්‍රදේශවල ව්‍යාප්ත වුනා.
ස්ථිර ජනාවාස දක්නට ලැබුනේ නැහැ (මේවා විස්තර විය යුතුය)
(ලකුණු 06) 2 + 4

**05.** I.A- බලංගොඩ සමනල
B- මිහින්තලේ
C- සීගිරිය
II. A - තෝනිගල
B - ගොඩවාය
C - ගොඩවාය
D – කොණ්ඩවට්ටවාන්
III. සතුරු ආක්‍රමණ - වාරි පද්ධතිය බිඳ වැටීම.
කෘෂි කර්මාන්තය බිඳ වැටීම - ලෙඩරෝග පැතිර යෑම.
රාජ්‍ය අනුග්‍රහය ගොවිතැන සඳහා නොලැබී යෑම.
ජනතාව නිරිත දිගට සංක්‍රමණය වීම.

IV. රට චෝල පාලනයෙන් මුදවා ගැනීම.
ස්ථාවර රාජ්‍ය පාලනයක් ඇති කිරීමට හැකි වීම.
කෘෂි කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කිරීම.
වෙහෙර විහාර පිළිසකර කිරීම / රට එක්සත් කිරීමට කටයුතු කිරීම.

**06.** I. පර්වතරාජ - නරේෂ්වර නර ඉසිර - දේවත්ව , බෝධිසත්ව
II. ගමේ සුලු ආරවුල් විසඳීම.
ගමේ සාමය පවත්වා ගෙන යෑම.
රජරට ගෙවිය යුතු අයබදු එකතු කිරීම.
ගම් වැව් නඩත්තුවට අවශ්‍ය එකතු කිරීම.
ගමේ අවශ්‍යතා සපුරා ලීම.

III. ගොවිතැන කන්න 2කට ප්‍රධාන වශයෙන් පැවතුනා

ඊට අමතරව අකලහස - මදහස - පිටදඩහස යනුවෙන් කන්න තුනක්වගා කළ බව කියවේ.

සතුන්ගෙන් ගොවිතැනට අවශ්‍ය සහයෝගය ගත්තා.

දේශීය ක්‍රම අනුගමනය කලා.

| | | |
|---|---|---|
| IV. දේශීය වෙළඳාම | - | රට අභ්‍යන්තරයේ 0000 ලෙස හැඳින්වූ වෙළඳ පළවල් තිබුනා. |
| | - | භාණ්ඩ ප්‍රවාහනය සඳහා අභ්‍යන්තර ජල මාර්ග උපයෝගී කර ගත්තා. |
| | - | දේශීය දේවල් වෙළඳාම් කළා |
| විදේශ වෙළඳාම | - | පට්ඨාන හෙවත් මහා තොටුපලවල් ආශ්‍රිතව පැවතුනා |
| | - | නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය කල බවට සාධක තිබේ. |
| | - | වටිනා වෙළඳ ද්‍රව්‍ය හුවමාරු උනා. |
| | - | (ඇත්දත් - ඇතුන් , අශ්වයින් , රෙදිපිළි , පිඟන් භාණ්ඩ) |

**07.** I.තල , උඳු , මුං , මෑ , මෙනේරි , කුරක්කන්

II.වලිඤ්ඤාර් වරු,

III.සීගිරි ජල මල් පොකුණු තැනවීමේ තාක්ෂණය , වැව් තාක්ෂණය විස්තර